# පොලිස් මාධ්‍ය කොට්ඨාසය

## பொலிஸ் ஊடகப் பிரிவு

## POLICE MEDIA DIVISION

14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල


| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.01.26 පැය 2030 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/149/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**දිවයින පුරා සිදු කරනු ලබන අපරාධ හා මත්ද්‍රව්‍ය මැඩලීමේ මෙහෙයුම සම්බන්ධව - පොලිස් මූලස්ථානය.**

ශ්‍රී පොලිසිය 2024 වෂර්යේ දෙසැම්බර් මස 22 වැනි දින සිට විශේෂ රථවාහන මෙහෙයුමක් ආරම්භ කළ අතර රට තුළ මාගර් විනයක් පවත්වා ගැනීම මෙන්ම අනතුරු අවම කර ගැනීම එහි ප්‍රධාන අරමුණ විය. මෙම මෙහෙයුම ආරම්භ කිරීමට ප්‍රථම දෛනිකව මාරක රිය අනතුරු මෙන්ම අනෙකුත් රිය අනතුරු වාතර්ා වීම් විශාල වශයෙන් පැවැති අතර එක් රිය අනතුරකින් පුද්ගලයින් හතරක් හෝ පහක් වැනි සංඛ්‍යාවක් මියයෑමේ අවස්ථාද වාතර්ා විය. ඒ අනුව එතෙක් සිදු කරගෙන පැවති රථවාහන මෙහෙයුම් නව මුහුණුවරකින් ආරම්භ කරන ලදී.

එම මෙහෙයුම්වල ප්‍රතිඵලයක් ලෙස මෙම 2025.01.01 දින සිට 2025.01.25 දක්වා කාලය සලකා බැලීමේදී මාරක රිය අනතුරු 129 ක් වාතර්ා වී ඇති අතර 2024 වෂර්යේ එම කාලය තුළ මාරක රිය අනතුර 155 ක් වාතර්ා වී ඇත. එය පෙර වෂර්ය හා සංසන්දනය කිරීමේදී මෙම දින 24 තුළ මාරක රිය අනතුරු 26 ක අඩුවීමක් වේ. මෙම රථවාහන මෙහෙයුම් සිදු කිරීමේදී සිවිල් ඇඳුමින් සැරසුණු පොලිස් නිලධාරීන් පොදු ප්‍රවාහන සේවා තුළට යොමු කර ඒ හරහා රියදුරන් සිදු කරන වැරදි පිළිබඳව ඔවුන් දැනුවත් කිරීමට මෙන්ම අවශ්‍ය අවස්ථාවන් වලදී නීතිය ක්‍රියාත්මක කිරීමටද කටයුතු කර ඇත. එමෙන්ම රථවාහනවල සවිකර තිබෙන අමතර කොටස් මඟින් වාහනය තුළ ගමන් කරන පුද්ගලයින්ට හා මාගර්යේ ගමන් කරන අනෙකුත් පුද්ගලයින්ට සිදුවන හානි අවම කිරීම සඳහා අන්තරාදායක කොටස් ඉවත් කිරීමටද අවශ්‍ය පියවර ගන්නා ලදී. ඒ සඳහා රියදුරන් වෙත සහන කාලයක් ලබාදීමටද ක්‍රියා කළ අතර අනතුරුදායක නොවන අලංකාරය සඳහා සවිකර ඇති කොටස් නීත්‍යානුකූලව ලියාපදිංචි සහතිකයට ඇතුලත් කරගැනීමට හෝ ඉවත් කිරීමට මාස 03 ක සහන කාලයක් ලබා දීමටද ක්‍රියා කරන ලදී.

2025.01.12 වන දින සිට අපරාධ හා මත්ද්‍රව්‍ය වැටලීමේ විශේෂ මෙහෙයුමක් ආරම්භ කරන ලදී. දිවයිනේ පොලිස් ස්ථාන 607 හා විශේෂිත අංශවල දායකත්වයෙන් නිරන්තරයෙන් මාගර් බාධක යොදවා මාගර්යේ සිටින සැකකටයුතු පුද්ගලයින්, සැකකටයුතු වාහන පරීක්ෂා කිරීම් සිදුකරන ලද අතර, එහිදී යම් අපරාධයක් කිරීම සඳහා සැලසුම් කරන පුද්ගලයන් සිටීද යන්න විශේෂ අවධානය යොමු කරන ලදී. මෙම මෙහෙයුම මඟින් ජනතාවගේ ජීවිත හා දේපල සුරක්ෂිත කර බියෙන් හා සැකෙන් තොරව තම දෛනික කායර්න් සිදු කර ගැනීමට අවශ්‍ය ඉඩ ප්‍රස්ථාව සැළසීම මෙහි මූලික අරමුණ විය.

මෙම දින 13 ක කාල සීමාව තුළ පුද්ගල පරීක්ෂා කිරීම් 277,572 ක් හා වාහන පරීක්ෂා කිරීම් 104,844 ක් සිදු කර ඇත. එමෙන්ම අපරාධ සඳහා ඍජුව දායක වූ නමුත් නීතිය මඟ හැර සිටි පුද්ගලයන් 249 දෙනෙකු හා වරෙන්තුකරුවන් 4020 ක් අත්අඩංගුවට ගැනීමට හැකි වී ඇත. මෙම මෙහෙයුම් තවදුරටත් අඛණ්ඩව සිදු කරන අතර එමඟින් සොරකම්, ගෙවල් බිඳුම් හා මංකොල්ලකෑම් වැනි අපරාධ අවම කරගැනීමේ වැඩපිලිවෙලක් ක්‍රියාත්මක වේ. එමෙන්ම පසුගිය දිනවල වාතර්ා වූ ගෙවල් බිඳුම් හා සොරකම් වැනි අපරාධවල අඩුවීමක් දක්නට ලැබීම තුළින් මෙම ක්‍රියාවලිය මේ වනවිට සාථර්කව පවතින බවට නිරීක්ෂණය වේ.

රට තුළ සිදුවන වෙඩි තබාගැනීමේ සිද්ධීන් වලට අදාලව ඊට සම්බන්ධ ප්‍රධාන අපරාධකරුවන් හා එම අපරාධ මෙහෙයවන ලද අපරාධකරුවන් අත්අඩංගුවට ගැනීම සහ රට තුළ ක්‍රියාත්මක වන ඔවුන්ගේ ජාලය හඳුනා ගැනීමට හැකි වූ අතර කෙටි කාලයක් තුළ අදාළ වෙඩි තැබීම සඳහා පැමිණි වෙඩික්කරුවන් අත්අඩංගුවට ගැනීමටද, ඔවුන්ගේ අවි ආයුධ පොලිස් භාරයට ගැනීමටද, ඒ සඳහා ආධාර අනුබල දුන් තැනැත්තන් නීතිය හමුවට ගෙන ඒමට හැකි විය.

එහිදී පසුගිය මාස 03 ක කාලය තුළ වෙඩි තබා ගැනීමේ සිදුවීම් වලට සම්බන්ධ සැකකරුවන් 84 දෙනෙක්, සංවිධානාත්මක වෙඩි තබාගැනීම් සඳහා භාවිතා කළ ටී56 ගිනි අවි 03 ක්, පිස්තෝල අවි 05 ක් හා අපරාධ සඳහා යොදාගත් යතුරුපැදි පොලිස් භාරයට ගැනීමට හැකිවිය. එමෙන්ම මෙම අපරාධ පිටුපස සිටින ප්‍රධානම අපරාධකරුවන් විදෙස්ගතව සිටිමින් මෙම ක්‍රියාවලිය මෙහෙයවන අතර ඔවුන් අත්අඩංගුවට ගැනීම සහ ඔවුන්ට එරෙහිව නීතිය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ලබයි.

තවද මාගර්යේ නිරන්තර යතුරුපැදි සංචාර හා ක්ෂණික මාගර් බාධක යොදවා තිබීම මඟින් පසුගිය දිනක ගල්කිස්ස පොලිස් වසමේ සිදු වූ වෙඩි තැබීමේ සිද්ධියේ වෙඩික්කරු සහ එම අවිය විනාඩි දහයක් හෝ පහළොවක් වැනි කෙටි කාලසීමාවක් තුළ පොලිස් භාරයට ගැනීමට හැකි විය. මන්නාරම ප්‍රදේශය සිදුවූ වෙඩි තැබීමේ සිදුවීමට අදාලව එම සියළුම සැකකරුවන් දින හතරක් හෝ පහක් වැනි කාලයක් තුළ අත්අඩංගුවට ගැනීමට හැකි විය.

මෙම වැඩපිළිවෙළට සමගාමීව රටේ ප්‍රධාන ගැටළුවක් ලෙස පවතින මත්ද්‍රව්‍ය උවදුර මධර්නය කිරීම සඳහා මත්ද්‍රව්‍ය නිවාරණ මෙහෙයුම් දියත් කරන ලද අතර පසුගිය කාලසීමාව තුළ පොලිස් ස්ථානවල බහුතර නිලධාරීන් ප්‍රමාණයක් යොදවා මත්ද්‍රව්‍ය වැටලීම් සිදු කරන ලදී. මෙම මාස 03 ක කාල සීමාව තුළ ගොඩබිමින් අල්ලා ගත් වැඩිම මත්ද්‍රව්‍ය ප්‍රමාණය අත්අඩංගුවට ගැනීමට හැකි විය. එම කාලය තුළ හෙරොයින් කිලෝග්‍රෑම් 355 ක්, කිලෝග්‍රෑම් 4076 ක්, හෂිස් මත්ද්‍රව්‍ය කිලෝග්‍රෑම් 186 ක්, අයිස් මත්ද්‍රව්‍ය කිලෝග්‍රෑම් 772 ක් හා සැකකරුවන් අත්අඩංගුවට ගෙන ඇත. මෙම මත්ද්‍රව්‍ය මෙහෙයුම් සඳහා විශේෂයෙන් යුධ හමුදාව, නාවික හමුදාව මෙන්ම ගුවන් හමුදාවද ශ්‍රී පොලීසිය වෙත අවශ්‍ය සහය ලබාදෙනු ලබයි.

යුධ හමුදා කඳවුරක් තුල අයිස් මත්ද්‍රව්‍ය ළඟ තබාගෙන සිටි යුධ හමුදා සෙබලුන් දෙදෙනෙකු, ඔවුන් විසින්ම භාරයට ගෙන ඉදිරි නෛතික කටයුතු සඳහා ශ්‍රී පොලිසියට ඉදිරිපත් කර තිබුණි. ඒ අනුව ශ්‍රී ලංකා යුධ හමුදාව මඟින්ද මෙම මෙහෙයුම සඳහා ප්‍රධාන දායකත්වයක් දක්වමින් සිටින අතර මේ සම්බන්ධයෙන් වැඩබලන පොලිස්පතිතුමා ඉදිරියේදී ඔවුන් වෙනුවෙන් විශේෂ තිළිණයක් හා ප්‍රශංසාවක් පිරිනැමීමට නියමිතය.

එමෙන්ම සිදු කරමින් පැවති පසුගිය කාලසීමාව තුළ යම් යම් හේතු මත මන්දගාමීව පැවැති විමශර්න මේ වනවිට කිසිම දේශපාලන බලපෑමකින් තොරව කඩිනමින් විමශර්න සිදුකරමින් පවති. එම විමශර්නවල ප්‍රගතිය අනුව අත්අඩංගුවට ගැනීම් හෝ අවශ්‍ය ඉදිරි නෛතික පියවර ගැනීමේ ක්‍රියාවලිය සිදුකරනු ලබයි. විශේෂයෙන්ම මුදල් විශුද්ධිකරණ පනත යටතේ හා අනෙකුත් නෛතික තත්ත්වයන්ට අනුකූල වන පරිදි නීතිපතිතුමාගේ උපදෙස් ලබාගෙන කටයුතු කරන අතර සිදුවූ ඝාතන සම්බන්ධයෙන්ද විමශර්න සිදු කරමින් පවතී. මෙම සියලු විමශර්න නිසි පරිදි අවසන් කර ඊට අදාළ වැරදිකරුවන් නීතිය හමුවට ඉදිරිපත් කර රට තුළ නීතිය හා සාමය ස්ථාපිත කර මහජනතාවට සාමකාමීව ජීවත්වීමට, සුරක්ෂිත පරිසරයක් බිහිකරලීම මෙම මෙහෙයුම් වල මූලික අරමුණ වේ.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**